# සිංහල

# විෂය මාලාව

# 2007

6 ශ්‍රේණි පළමුවන බස සිංහල විෂය නිර්දේශ අන්තර්ගතයි.

සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

නිපුණතා පාදක ව සකස් කර ඇති මෙම විෂයමාලාව, භාෂා

ශක්‍යතාව සංවර්ධනය මෙන් ම සන්නිවේදන ශක්‍යතාව

සංවර්ධනය ද ප්‍රමුඛ කර ගත්තකි.

පාසලේ දී පමණක් නොව මුළු ජීවිත කාලයේදී ම

ප්‍රායෝගික භාෂා කාර්යයන්හි දී

විපුල ඵල නෙලා ගත හැකි වන පරිදි

නිපුණතා රැසක් ප්‍රගුණ කර ගැනීම අවධාරණය කර ඇත.

# සිංහල

## විෂය නිර්දේශය

(2007 වර්ෂයේ සිට ක්‍රියාත්මකයි.)

## 6 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

1.0 නිපුණතාව

සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි..

1.1 සංවාදයකට සවන් දී ප්‍රතිචාර දක්වයි.

- සංවාදයකට සවන්දීම
  - ශිෂ්‍ය අභිරුචීන් හා වයස් මට්ටම සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද සංවාදයක්

1.2 විවිධ ප්‍රකාශනවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.

- අන්තර්ගතය ග්‍රහණය කර ගැනීම.
  - අසන සහ ඇසෙන දෑ නිරවුල් ව ග්‍රහණය කරගෙන නිවැරදි ව ප්‍රතිචාර දැක්වෙන ලෙස අදාළ කතාවක් ප්‍රවෘත්තියක්, ගද්‍ය, පද්‍ය කොටසක් හෝ ගීතයක්

    (නිදසුන් - කළුවා මාරපන ගියා වගේ ජනකතාව)

1.3 ආචාරශීලී ව හා සංයමයෙන් යුතුව සවන් දී ප්‍රතිචාර දක්වයි.

- සාවධානව සවන්දීම හා අවස්ථාවෝචිත ව ප්‍රතිචාර දැක්වීමට අදාළ ව පන්ති කාමර තුළ මිතුරන් අතර ඇතිවන කතා බහ.

  මෙහිදී එය සංවාදයට සම්බන්ධ පුද්ගලයන් හා සංවාදය පවතින ස්ථානය අනුව සංයමය හා සංවාදයේ ස්වරූපය වෙනස්වන බව අවධාරණය කෙරෙයි.

  නිදසුන් -

  - මිතුරන් අතර ඇතිවන කතාබහේ ස්වරූපය හා ඔවුන් වැඩිහිටියන් සමඟ කරන කතා බහේ ස්වරූපය වෙනස්වන බව.
  - මිතුරන් අතර ක්‍රීඩාපිටියේ දී සිදුවන කතාබහේ ස්වරූපය හා පාසල් විවාදයක දී ඇතිවන සංවාදයේ දී භාෂාවේ ස්වරූපය වෙනස්වන බව.

1.4 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසඥතාව වර්ධනය කර ගනියි.

- ගද්‍ය හෝ පද්‍ය නිර්මාණ.

  නිදසුන් - ළමා නාට්‍ය, ළමා ගී.

2.0 නිපුණතාව

අර්ථවත් කථනයෙන් ප්‍රකාශන ශක්තිය වර්ධනය කර ගනියි.

2.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.

- අත්දැකීම් විස්තර කිරීම.
- සිදුවීම් විස්තර කිරීම.
- ජන කතාවක් / කතන්දරයක් ඉදිරිපත් කිරීම.

2.2 අවස්ථාවට උචිත ලෙස සවන් දෙන්නා පිළිබඳ සැලකිලිමත් ව කතා කරයි.

- මිතුරන් අතර ඇතිවන කතාබහ.
  - ස්ථානය අනුව කතාබහේ ස්වරූපය වෙනස්වන බව අවධාරණය කෙරේ.

- වැඩිහිටියන් සමඟ ඇතිවන කතාබහ.
  - කතාබහේ යෙදෙන පුද්ගලයින් අනුව කතාබහේ ස්වරූපය වෙනස්වන බව අවධාරණය කෙරේ.
- චරිතාරෝපිත කතා.

3.0 නිපුණතාව

ජීවන අත්දැකීම් ලබා ගැනීම සඳහා කියවීමේ පුරුදු වර්ධනය කර ගනියි.

3.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි.

- අල්පප්‍රාණ, මහාප්‍රාණ අකුරු නිවැරදි ව උච්චාරණය කිරීම.
- ප්‍රශ්නාර්ථ, විසමයාර්ථ වැනි විරාම ලක්ෂණ පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
  ප්‍රශ්නාර්ථ - ඔබේ නම මොකක් ද?
  විස්මයාර්ථ - අපොයි ! දෙයියනේ.
  අනේ ! ගහන්න එපා.
- ජනප්‍රිය, දේශප්‍රේමී, ක්‍රම ක්‍රමයෙන් වැනි වචන නිවැරදි ව උච්චාරණය කිරීම.

3.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.

- ඡේදයක් නිශ්ශබ්ද ව කියවා අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම.
  නිදසුන්
  ජීවිතාදර්ශ ලබා ගත හැකි චරිත කතාවක්.

3.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.

- චරිතාරෝපිත කියවීම. යම් චරිතයකට අදාළ දෙබසක් ඛණ්ඩයක් චරිතාරෝපිත ව කියවීම.
- නාට්‍යයක චරිතයක් නාට්‍යානුසාරී ව හඬ උස් පහත් වන අයුරින් කියවීම.

4.0 නිපුණතාව

අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් තර්කානුකූල ව ඉදිරිපත් කරයි.

- මාතෘකානුකූල ඡේද ලිවීම.
  (ඡේද ලිවීමේ දී සැලකිලිමත් විය යුතු ශිල්පීය දක්ෂතා අවධාරණය විය යුතුය.)

4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

- විරාම ලකුණු

- තිත

  වාක්‍යයක අග යෙදේ.
  අපි පාඩම් කරමු.
  පද කෙටි කිරීම යෙදේ.
  සමුපකාර තොග වෙළඳ සංස්ථාව - ස.තො.ස.
  ලංකා විදුලිබල මණ්ඩලය - ලං.වි.ම.
  ගොඩනැගිල ද්‍රව්‍ය සංස්ථාව - ගො.ද්‍ර.ස.
  තිස්ස රත්නායක - ති. රත්නායක.
  බුද්ධ වර්ෂ - බු.ව.
  ක්‍රිස්තු වර්ෂ - ක්‍රි.ව.
  පෙරවරු - පෙ.ව
  රුපියල් ශත - රු. ශ.

- කොමාව

  දිග වාක්‍යයක් හොඳින් අවබෝධකර ගැනීම සඳහා කොටස් කර ගැනීමේ දී යෙදේ.
  උදා - ඉර පායාගෙන එද්දී නෙළුම් පිපෙයි, කුමුදු පරවෙයි, සිසිල් සුළං හමා එයි.

- ප්‍රශ්නාර්ථ ලකුණ

- ප්‍රශ්නාර්ථවත් වාක්‍යවල අග යෙදේ.
- උදා - ඔබ ඉගෙන ගන්නේ ඇයි ?

5.0 නිපුණතාව

හාෂා ක්‍රියාකාරකම් මඟින් වාග් මාලාව පෝෂණය කර ගනියි.

5.1 සාම්ප්‍රදායික යෙදුම් භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි.

- යුගල පද

  යුගල පද වර්ග

  සමාන වචන සහිත යුගල පද වර්ග
  සැප - සනීප, සතා - සීපාවා, සතුටු - සාමීචි
  සරු - සාර, සැක - සංකා, වැනි පද

විරුද්ධාර්ථ වචන සහිත යුගල පද .
අය - වැය, ගොඩ - මඩ, ලූණු - ඇඹුල්,
දිනුම් - පැරදුම්, අඩු - වැඩි, යාම - ඊම වැනි පද

අර්ථ විරහිත ආසන්න රූප වචන යෙදීම.
පඩි - නඩි, නහින - දෙහින, වං - හුං,
උදවු - පදවු, අන්දුන් - කුන්දුන් වැනි පද.
යුගල පද ඇතුළත් නිර්මාණ කිරීම.

- ප්‍රස්තාව පිරුළු
  ප්‍රස්තාව පිරුළු වර්ග
  කතා මුල්කරගත් ප්‍රස්තාව පිරුළු
  - පුහුල් හොරා කරින් දැනේ
  - පල නොකියා පලා බෙදුවා වගේ
  - ගමරාල අට සිල් ගත්තා වගේ
  - කැකිල්ලේ රජුගේ නඩු තීන්දුව වැනි පිරුළු.
- තේරවිලි කවි
- උපමා / උපමේය භාවිතය

5.2 විවිධ භාෂා ව්‍යවහාර හඳුනාගනිමින් සන්නිවේදනය පහසු කර ගනියි.

- ප්‍රාදේශීය ව්‍යවහාර
  ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයන් සහිත චරිත කතාවක හෝ නව කතාවක හෝ වෙනත් නිර්මාණයක කොටසක්

නිදසුන් - මාර්ටින් වික්‍රමසිංහයන්ගේ කෘතියකින් උපුටාගත් කොටසක්
- පියසේන කහඳගමගේ මහතාගේ කෘතියකින් උපුටාගත් කොටසක්

6.0 නිපුණතාව
ජීවන අවශ්‍යතා සාක්ෂාත්කරණය සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

6.1 අදහස් නිරවුල් ව නිවැරදි භාෂා භාවිතයෙන් ලිපි ලියයි.

- පෞද්ගලික ලිපියක් ලිවීම.
  - ලිපියේ ආකෘතිය.
  - අන්තර්ගතය සකස්විය යුතු ආකාරය.
  - ඡේද බෙදීම.
  - සංවාදයක් හෝ සිද්ධියක් ඇසුරෙන් පෞද්ගලික ලිපියක් ලිවීම සඳහා මඟ පෙන්වීම.

7.0 නිපුණතාව

අක්ෂර හා අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කරමින් ලියයි.

7.1 ණ, න, ල, ළ, ශ, ෂ, ස අකුරු සහිත වචන නිවැරදි ව ලියයි.

- න, ණ, ල, ළ භාවිතය පිළිබඳ සරල රීති
  ර යන්නට පසුව යෙදෙන්නේ ණ යන්න
  සරණ, පරණ, තරුණ, වරුණ, වර්ණ.
  තාලුජ ශ ට පසුව යෙදෙන්නේ දන්තජ න වේ.
  ප්‍රකාශන, දර්ශන, ප්‍රශ්න, නිදර්ශන.
  පිළි යන්නෙන් ආරම්භවෙන පදවල ළ බොහෝවිට මූර්ධජ වේ.
  - පිළිතුරු
  - පිළිපදිනවා
  - පිළිවෙළ
  - පිළියම්
  - පිළිරූ
  - පිළිසඳර
  - පිළිසකර
- නාම පදයක එක ළඟ ල දෙකක් යෙදෙනවිට මුලින් යෙදෙන්නේ මූර්ධජ ළ යන්නය.
  වළලු, පළල, බළලා

- ශ, ෂ, ස භාවිතය හා සම්බන්ධ සරල රීති
  ශ - තාලුජ ශ සමඟ එක ළඟ යෙදෙන්නේ තාලුජ අක්ෂරයි.
  දුශ්චරිත, නිශ්චය, විනිශ්චය.
  ව වලට මුලින් යෙදෙන ශ යන්න තාලුජ බව.
  අශ්ව, විශ්ව, පාර්ශව, විශ්වාස
  ෂ - මූර්ධජ අකුරුවලට පෙර යොදන ෂ මූර්ධජ බව
  1. අෂ්ට, ශිෂ්ට, විශිෂ්ට
  2. ශ්‍රේෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ, ධර්මිෂ්ඨ
  3. දූෂණය, පර්යේෂණ, පාෂාණ
- ශ, ෂ එක ළඟ යෙදෙන වචනවල මුලින් තාලුජ ශ යන්නත් පසුව මූර්ධජ ෂ යන්නත් යෙදේ.
  විශේෂ, විශිෂ්ට, ශිෂ්ට, අවශේෂ

7.2 මහප්‍රාණ අක්ෂර නිවැරදි ව වචනවල යොදයි.

- වචනවල මහප්‍රාණ අල්පප්‍රාණ අක්ෂර නිවැරදි ව යෙදීම.
  ලේඛන, ලේකම්, පුස්තකාලය, සමස්ත, වාර්තාව.

7.3 සඤ්ඤක අකුරු අර්ථවත් ව හා නිවැරදි ව වචනවල යොදයි.

- සඤ්ඤක අකුරු යෙදීමෙන් වචනවල අර්ථය වෙනස්වන බව.

| | |
|---|---|
| අගල | අගල |
| ඇට | ඇද |
| ඇදීම | ඇදීම |
| අදිනවා | අදිනවා |
| කද | කද |

8.0 නිපුණතාව

වියරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටුකර ගනියි.

8.1 නාම පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

- නාම පද
  නාමපදවල ප්‍රාණවාචී, අප්‍රාණවාචී භේදය
  ප්‍රාණවාචී - බල්ලා, මිනිසා, ළමයා, කාන්තාව, කුරුල්ලා.
  අප්‍රාණවාචී - ගස, මේසය, පොත, අත්ත

  නාමපදවල වචන භේදය

| ඒක වචන | බහු වචන |
|---|---|
| බල්ලා | බල්ලෝ |
| මිනිසා | මිනිස්සු |
| ළමයා | ළමයි |
| කුරුල්ලා | කුරුල්ලෝ |
| ගස | ගස් |
| මේසය | මේස |
| පොත | පොත් |
| අත්ත | අතු |

සර්ව නාම පද

| | |
|---|---|
| මම | අපි |
| ඔහු | ඔවුහු |
| ඔබ | ඔබ |
| ඈ / ඕ | ඔවුහු |
| ඌ | |
| එය | ඒවා |

ප්‍රාණවාචී පදවල ස්ත්‍රීලිංග පුරුෂ ලිංග භේදය

| | |
|---|---|
| බල්ලා | බැල්ලී |
| වඳුරා | වැඳිරි |
| කුරුල්ලා | කිරිල්ලී |
| මුණුපුරා | මිනිපිරී |
| කුකුළා | කිකිළී |

ප්‍රාණවාචී නාමපදවල උක්ත අනුක්ත භේදය

| | |
|---|---|
| ළමයි | ළමයින් |
| කුරුල්ලෝ | කුරුල්ලන් |
| මම | මා |
| අප | අප |
| ඔහු | ඔවුන් |
| ඔවුහු | ඔවුන් |
| ඔබ | ඔබ |

- නිපාත පද

  සඳහා, වෙනුවෙන් වැනි, වගේ වැනි නිපාත පද සමග යෙදෙන නාමපද අනුක්ත වන බව

  ළමයින් සඳහා

  කාන්තාවන් වෙනුවෙන්

  මා වැනි

8.2 ක්‍රියා පද සාධනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

- ක්‍රියා පද

  සරල වාක්‍යවල ක්‍රියාපද (අනතීත)
  කුරුල්ලා ඉගිලෙයි.
  කුරුල්ලා ඉගිලෙන්නේ ය.
  බල්ලා බුරයි.
  ළමයා සෙල්ලම් කරයි.
  කුරුල්ලෝ ඉගිලෙති.
  බල්ලෝ බුරති
  ළමයි සෙල්ලම් කරති.
  ළමයි හෙට පාසල් යති.

  සරල වාක්‍යවල ක්‍රියාපද (අතීත)
  කුරුල්ලා ඉගිලුණේ ය.
  බල්ලා බිරී ය.
  ළමයා සෙල්ලම් කළේ ය.
  කුරුල්ලෝ ඉගිලුණ හ.
  බල්ලෝ බිරූ හ.
  ළමයි සෙල්ලම් කළෝ ය.

  විධි ක්‍රියා
  කථා ව්‍යවහාරයේ දී විධි ක්‍රියා විවිධ ස්වරූපයෙන් යෙදුණ ද ලේඛන ව්‍යවහාරයේ දී එක ම ස්වරූපයක් ගනී.
  ඔබ යන්න.
  ඔබ ක්‍රීඩා පිටියට යන්න.
  ඔබ හෙට පාසල් එන්න.

8.3 උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය ගැන අවබෝධයෙන් සරල වාක්‍ය නිර්මාණය කරයි.

වාක්‍යවල උක්තය කර්මය ආඛ්‍යාතය ආදී අංග හඳුනා ගැනීම සහ උක්ත ආඛ්‍යාත සම්බන්ධය ගැලපීමෙන් සරල වාක්‍ය නිර්මාණය කිරීම.

## 9.0 නිපුණතාව

භාෂා භාවිතය මගින් සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය වර්ධනය කර ගනියි.

9.1 සංස්කෘතික උරුමයන් හා හර පද්ධතීන් පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

- සංස්කෘතික හා ජාතික උරුමය පිළිබඳ සාහිත්‍ය නිර්මාණයක්
  නිදසුන් - චාරිතාක්ෂණය පිළිබඳ ලිපියක්

9.2 කියවීම මගින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි.

- පැරැන්නන්ගේ සිරිත් විරිත් පිළිබඳ තොරතුරු අන්තර්ගත නිර්මාණයක්

9.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

- දේශාභිමානී හැඟීම් දනවන ගද්‍ය හෝ පද්‍ය හෝ නිර්මාණයක්.

10.0 නිපුණතාව

නව සාහිත්‍ය, දාර්ශනික, විද්‍යාත්මක සහ තාක්ෂණික දැනුමෙන් යුත් නිර්මාණ පරිශීලනයෙන් භාෂා හැකියාව වර්ධනය කර ගනියි.

10.1 විද්‍යාත්මක තාක්ෂණික තොරතුරු ඇතුළත් පොතපත අවබෝධයෙන් කියවා ලබාගත් කරුණු භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

- විද්‍යාඥයින්ගේ චරිතවල රසමුසු තැන් නිර්මාණාත්මක ව ඉදිරිපත් කර ඇති අවස්ථා.

11.0 නිපුණතාව

රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

11.1 ගද්‍ය හා පද්‍ය නිර්මාණ කියවා රස විඳියි.

- ළමා ගද්‍ය, පද්‍ය, නාට්‍ය කථාන්තර වැනි නිර්මාණ .

නිදසුන්

ළමා ගී - හඳ පානේ - සුනිල් ශාන්ත
ගද්‍ය - මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ
නාට්‍ය - නරි බැනා - දයානන්ද ගුණවර්ධන
නූතන ළමා ගී

12.0 නිපුණතාව

අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

12.1 පද්‍ය රචනා නිර්මාණය කරයි.

- නිදහස් පද්‍ය රචනය
    - නිදහසේ තෝරාගත්තා මාතෘකා යටතේ පද්‍ය රචනය.
- මාතෘකානුගත පද්‍ය රචනය

12.2 නිර්මාණාත්මක වාක්‍ය රචනා ලියයි.

- කැමති මාතෘකාවකට අනුව නිදහසේ වාක්‍ය රචනා ලිවීම.
- දෙනු ලබන මාතෘකාවකට අනුව වාක්‍ය රචනා ලිවීම.

12.3 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

- බිත්ති පුවත්පත් සකස් කිරීම හා ඒ සඳහා ගද්‍ය හා පද්‍ය නිර්මාණ කිරීම.
  රචනා, කවි, ටිකිරි කථා, ඡේද
    - මුද්‍රිත මාධ්‍යවල ළමා පිටු සඳහා නිර්මාණ කිරීම.